සියළුම හිමිකම් ඇවිරිණි /All Rights Reserved

Royal College - Colombo 07

රාජකීය විද්‍යාලය - කොළඹ 07

Grade 8 - Diagnostic Test – September 2022

අනාවරණ පරීක්ෂණය - 8 ශ්‍රේණිය - 2022 සැප්තැම්බර්

කාලය : පැය 1
Time: 1 hour

ගණිතය

Name: - .... class: -................. Index no: - ....

I කොටස

ප්‍රශ්න සියල්ලට ම මෙම පත්‍රයේම පිළිතුරු සපයන්න.

1. 10,4,11,12,18 මෙම සංඛ්‍යා වලින්,

    (1) සමචතුරස්‍ර සංඛ්‍යාවක්,

    (2) ත්‍රිකෝණ සංඛ්‍යාවක් ලියන්න.

2. 58^0 හි පරිපූරක කෝණය ලියන්න.

3. බද්ධ කෝණ යුගලයක ඇති ලක්ෂණයක් ලියන්න.

4. (-3) හි ආකල ප්‍රතිලෝමය ලියන්න.

5. 15.02t, kg වලින් පමණක් ලියන්න.

6. $\sqrt{36} \times \sqrt{5^2 \times 2^2}$ හි අගය සොයන්න.

7. $(-2)^3$, $(-3)^2$, $(-1)^5$ මෙම සෘණ නිඛිල ආරෝහණ පිළිවෙලට ලියන්න.

8. $48 = 2 \times 2 \times 2 \times 2 \times 3$

$60 = 2 \times 2 \times 3 \times 5$

ඉහත ප්‍රථමක සාධකවල ගුණිත ඇසුරින් පමණක් 48 හා 60 හි ම.පො.සා. සොයන්න.

9. පූර්ණ වර්ගයක් වන සංඛ්‍යාවක එකස්ථානයේ තිබිය හැකි ඉලක්කම් පහත සංඛ්‍යා අතුරින් තෝරා යටින් ඉරක් අඳින්න.

2, 4, 3, 5, 7

10. $a = 2$, $b = (-1)$, $c = 3$ නම් $a + 2b + c$ හි අගය සොයන්න.

11. තුන්වන වර්ග සංඛ්‍යාව ලැබෙනුයේ කුමන ඔත්තේ සංඛ්‍යා එකතු කිරීමෙන් ද?

12. $4a^2 b^2$ ගුණිතයක බලයක් ලෙස ලියන්න.

13.



AB හා CD සරල රේඛා වේ. X හි අගය සොයන්න.

14. $2pq - 4p^2$ සාධක සොයන්න.

15. $\frac{(-5) \times \square}{\square} = (+10)$ හිස්තැන් පුරවන්න.

(ල. 2x15=ල.30)

PAST PAPERS WIKI

සියලුම විෂයන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් ලබා ගැනීමට Past Papers Wiki වෙත පිවිසෙන්න

Past Papers Wiki

II කොටස

ප්‍රශ්න සියල්ලට මෙම පත්‍රයේම පිළිතුරු සපයන්න.

01) i.



ii.



ඉහත දැක්වෙන රූප වල පරිමිතිය සොයන්න.

(ල2)

iii.

ඉහත x හා y මගින් දැක්වෙන්නේ දිග 60cm බැගින් වූ සමාන දිගින් යුත් කම්බි කැබලි දෙකකි.

i. ශිෂ්‍යයෙක් x කම්බිය සම්පූර්ණයෙන් යොදගෙන සමපාද ත්‍රිකෝණයක් සාදයි. එහි දළ රූපයක් ඇඳ පාදවල දිග ලියන්න.

(ල2)

ii. Yකම්බිය භාවිතයෙන් 20cm දිගවින සෘජුකෝණාස්‍රාකාර රාමුවක් සාදයි. එහි දළ රූපයක් ඇඳ එහි දිග හා පළල ලියන්න.

(ල2)

iii. ශිෂ්‍යයා විසින් සමපාද ත්‍රිකෝණයේ එක් පාදයක් ඉවත් කර ඉතිරි කොටස සෘජුකෝණාස්‍රයේ දිග පැත්ත හා සම්බන්ධ කර සංයුක්ත තල රූපයක් සාදයි. එහි දළ රූපයක් ඇඳ සංයුක්ත රූපයේ පරිමිතිය සොයන්න.

(ල4)

(02) පන්ති කාමරයේ ඔබ විසින් ඝන වස්තු නිර්මාණය කිරීම යටතේ සිදුකළ ක්‍රියාකාරකම සිහියට නගන්න.

i. නිර්මාණය කළ ඝනවස්තු අතරින් සමපාද ත්‍රිකෝණ පමණක් යොදාගනිමින් නිර්මාණය කළ ඝන වස්තු දෙකක නම් ලියන්න. (ල2)

ii. ඉහත (i) හි නම් නොලියන ලද ප්ලේටෝ කැට දෙකක නම් ලියන්න. (ල2)

iii.



i. මෙම සංයුක්ත ඝන වස්තුවේ ,

a. දාර -

b. ශීර්ෂ -

c. මුහුණත් -

ගණන ලියන්න.

(ල3)

i. ඔයිලර් සම්බන්ධතාවය ලියන්න.

(ල1)

ii. මෙම ඝන වස්තුව ඔයිලර් සම්බන්ධතාවයට ගැලපෙන බව පෙන්වන්න. (ල2)

සියලුම විෂයන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් ලබා ගැනීමට Past Papers Wiki වෙත පිවිසෙන්න